**විසර්ජන ශීර්ෂය 177 -සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |

2. **ගිණුම්**

2.1 **විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,559,491,750 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,198,872,696 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.266,827,402 ක් හා රු. 93,791,652 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23.47 ක් හා 22.19 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 177 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 536,730,000 | 600,100,000 | 490,789,786 | 379,212,812 | 45,940,214 | 220,887,188 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 286,161,750 | 136,500,000 | 270,403,571 | 58,466,527 | 15,758,179 | 78,033,473 |
| | එකතුව | 822,891,750 | 736,600,000 | 761,193,357 | 437,679,339 | 61,698,393 | 298,920,661 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 177 | 17701 | 35,000,000 | 13,545,658 | 14,000,000 | 14,998,747 | 111,100,000 | 64,352,448 |
| 206 | 20601 | 17,000,000 | 4,340,948 | 6,500,000 | 10,140,283 | 86,000,000 | 41,602,118 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.32,631,404 ක්වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0054/000 | 23,263,592 |
| සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0003/0200/000 | 964,702 |
| | 6000/0000/00/0015/0088/000 | 8,403,110 |
| එකතුව | | 32,631,404 |

## 2 කොටස

### එක් එක් විසර්ජන ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

1. **විසර්ජන ශීර්ෂය 177 - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

1.1 **විගණන විෂය පථය**

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 **විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ ) සිට ( ඉ ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ ) **ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 17701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම |

(ආ) **පිළිතුරු නොළත් විගණන විමසුම්**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2013 අගෝස්තු 01 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විගණන විමසුමට අදාල ගණනය කළහැකි ගනුදෙනුවේ වටිනාකම රු.32,826,442 ක් විය.

(ඇ) **අයවැය විචලනය**

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු. 7,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 63 ත් සියයට 90 ත් අතර පරාසයක ප්‍රමානයක් ගෙන තිබුණි.

(iii) සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සළසා තිබුණු රු.180,000,000 ක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 38 ක් අදාල ව්‍යාපෘතිය වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ඈ) **පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවා තිබුණු එකතුව රු.747,362 ක්වූ තැන්පතු ශේෂ 16 ක් සම්බන්ධව මු.රෙ.571 පරිදි කටයුතු කර නොතිබුණි.

(ඉ ) <u>**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය - විෂය අංක 17701**</u>

(i ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි අයවීම් වල එකතුව රු.1,285,396 ක්වූ අතර, එම ශේෂ අතරින් රු.901,086 ක ණය ශේෂ අයකර ගැනීම් දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) සේවය හැරගොස් තිබුණු සේවකයන් 10 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.821,889 ක ණය හා අත්තිකාරම් 2013 ජුනි 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(iii) ස්ථාන මාරුවී ගිය වර්ෂ 1 කට වැඩි කාලයක් ගතවී ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.50,300 ක් හා රු.434,061 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 1.4 <u>යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය</u>

### 1.4.1 <u>සංයුක්ත සැලැස්ම</u>

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්ම අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ එම සැලැස්ම (2012 – 2016) පිළියෙල කර තිබුණේ 2012 සැප්තැම්බර් 10 දින දීය.

### 1.4.2 <u>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>

සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම 2012 සැප්තැම්බර් දක්වා ප්‍රමාද කර තිබූ හෙයින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූලව සකසා නොතිබුණි.

### 1.4.3 <u>වාර්ෂික කාර්ය සාධන වාර්තා</u>

ඉහත 1.4.1 ඡේදයෙහි ඇතුළත් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 402 (1 ) ප්‍රකාර අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජූලි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

1.4.4 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2012 සැප්තැම්බර් 04 දිනදීය.

1.5 **වත්කම් කළමනාකරණය**

(අ ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2012 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 ජුනි 30 දින වන විටත් පවත්වා නොතිබුණි.

(ආ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ඩබල් කැබ් රථයක් 2001 වර්ෂයේදී සමෘද්ධි, පාර්ලිමේන්තු කටයුතු හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයට රැගෙන ගොස් තිබූ අතර එය නැවත ලබා ගැනීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. තවද අමාත්‍යාංශය සතු ජීප් රථයක් විධිමත්ව පැවරීමකින් තොරව මධ්‍යම සංස්කෘතික අරමුදලේ භාවිතය සඳහා 2005 වර්ෂයේ සිට ලබාදී තිබුණි.

(ඇ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු වත්කම් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

(i) ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණු මෝටර් රථ 05 ක් 2011 වර්ෂයේ සිට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදාගෙන තිබූ අතර, පුද්ගලික බස් රථ ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර තිබූ එක් මෝටර් රථයක්ද අමාත්‍යාංශයේ

පරිහරණය සඳහා යොදාගැනීමෙන් පසු 2008 වර්ෂයේ සිට ධාවනය කළ නොහැකි තත්ත්වයට පත්ව අමාත්‍යාංශ රථගාල තුළ ගාල් කර තිබුණි.

(ii) මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් රු.**7,900,000** ක් වටිනා කැබ් රථයක් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ පාවිච්චිය සඳහා ලබාදී තිබුණි.

(ඈ) <u>පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම</u>

ඉඩම් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව පහත සඳහන් පරිදි ඉදිකිරීම් සිදුකර තිබුණි.

(i) 2012 වර්ෂය අවසානය වන විට රු.53,686,030 ක් වැයකර ඉදිකර තිබූ වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙහි අයිතිය සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් 2012 වර්ෂය අවසානය වන විට ප්‍රාදේශීය වශයෙන් සංස්කෘතික මධ්‍යස්ථාන 160 ක් පිහිටුවා තිබූ අතර ඉන් 152 ක්ම ඉදිකර තිබූ ඉඩම් වල අයිතිය අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි.

1.6 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | <u>ව්‍යවස්ථාපිත විධිවිධාන</u> | | |
| (i) | 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 8 ඒ (1) වගන්තියේ විධිවිධාන | 53,686,030 | නාගරික සංවර්ධන අධිකාරියේ අවසර පත්‍රයක් ලබානොගෙන වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සිදුකර තිබුණි. |
| (ii) | 2008 ජුනි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (2008 මැයි 27 දිනැති අංක සීඒ/16/2008 දරන අමාත්‍ය මණ්ඩල සන්දේශය) | 4,800,000 | දඹාන ආදිවාසී ජන උරුම කේන්ද්‍රය නඩත්තුව හා ප්‍රවර්ධන කටයුතු සඳහා යෝජිත වැඩ සටහනක් හා පිරිවැය ඇස්තමේන්තුවක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් |

| | | | |
|---|---|---|---|
| | | | කිරීමෙන් තොරව 2009 සිට 2012 දක්වා මාසිකව රු.100,000 බැගින් අමාත්‍යාංශය විසින් දඹාන ආදිවාසී ජන උරුම කේන්ද්‍රය වෙත ගෙවීම් කර තිබුණි. |
| (ආ) | <u>මුදල් රෙගුලාසි</u> | | |
| | මු.රෙ.71 (1) , (2 ) හා 156 (7) | 841,906 | "සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය" ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශයේ අභිමතය පරිදි තනතුරු 3 ක් ඇති කර ඒ සඳහා නිලධාරීන් බඳවා ගෙන වැටුප් සහ දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u> | | |
| | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන චක්‍රලේඛයේ 02 ඡේදය සහ 2013 ජනවාරි 31 දිනැති අංක 157 (1) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 02 ඡේදය | 1,420,820 | එක් නිලධාරියෙකුට හිමි උපරිම ආපදා ණය මුදල වූ රු.250,000 සීමාව ඉක්මවා නිලධාරීන් 4 දෙනෙකු සඳහා ණය ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ඔවුන්ගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂ එකතුව රු.1,420,820 ක් විය. එසේ සීමාව ඉක්මවා ගෙවා තිබුණු මුදල ආපසු එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | <u>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u> | | |
| (i) | 2.8.1 හා 2.8.3 මාර්ගෝපදේශ | 2,199,113 | ඉංජිනේරු ඇස්තමේන්තුව රු.2,199,113 ක්වූ වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානයේ ii අදියර ඉදිකිරීම සඳහා ඉදිරිපත් වූ ලංසු |

| | | | |
|---|---|---|---|
| | | | ඇගයීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන වලින් බැහැරව පුද්ගලික සමාගමක ඉංජිනේරුවරයෙකු වෙත පුද්ගලිකව පවරා ඇගයීම් වාර්තාව ලබාගෙන තිබුණි. |
| (ii) | 3.8.1 මාර්ගෝපදේශය | 3,678,599 | සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා හදිසි මිලදී ගැනීම් ලෙස රු.3,678,599 ක භාණ්ඩ මිලදී ගෙන තිබුණද, එම මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව සිදුකර තිබුණි. |
| (iii) | 5.2.1 (අ ), (ආ) මාර්ගෝපදේශ | | ලංසු ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳ සියළු තොරතුරු ඇතුළත්ව ලංසු කැඳවීමේ ලේඛන පිළියෙල කර නොතිබුණි. |
| (iv) | 6.2.2 සහ 5.6 මාර්ගෝපදේශ | | ලංසු ඉදිරිපත් කළයුතු අවම කාල සීමාව හා පිරිවිතර සඳහන් කර නොතිබුණි. |
| (v) | 3.4.3 (ඇ) සහ 8.1.1 මාර්ගෝපදේශ | 1,987,402 | වානේ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා තිබූ අතර ඉදිරිපත් කළ ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමුකර ඇගයීම් වාර්තා ලබාගෙන නොතිබුණි. |

1.7 **<u>කාර්ය සාධනය</u>**

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**<u>ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්</u>**

අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබූ කාර්යන් පහත දැක්වේ.

(අ ) වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානයේ 2011 සහ 2012 වර්ෂ සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් පිළිවෙලින් රු.1,911,218 ක් සහ රු. 1,165,864 ක් වැය කර තිබුණද එම වර්ෂවලදී එහි පවත්වා තිබූ පුහුණු වැඩමුළු සංඛ්‍යාව පහත පරිදි විය.

| | 2011 වර්ෂය | 2012 අගෝස්තු දක්වා |
|---|---|---|
| විදේශ සංචිත පුහුණු වැඩ මුළු | 02 | 03 |
| කාර්ය මණ්ඩල ප්‍රවර්ධන වැඩ සටහන් | 04 | 01 |
| සම්පත් දායක පුහුණු වැඩමුළු | - | 01 |

(ආ) 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ මෙම සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය සඳහා එහි දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්ය පරිපාටිය ඇතුළත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර එවන් සැලැස්මක් මත වාර්ෂික ක්‍රියාකාරී වැඩ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමක් සිදුවී නොතිබුණි.

1.8 **<u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>**

අමාත්‍යාංශය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම l අදියරට අදාලව ප්‍රමාණ පත්‍රයේ සඳහන් සමහර විෂයයන් වලට අනුකූල නොවී කරන ලද වැඩ සඳහා අඩු කිරීමකින් තොරව රු.816,800 ක්වූ මුළු මුදලම ගෙවා තිබුණි.

(ආ) ප්‍රමාණ පත්‍රය - A අයිතමයේ - A – 1 සිට - A – 5 දක්වා වූ විෂයයන් වල ඉටු නොකළ කාර්යයන් සඳහා රු.18,500 ක් ගෙවා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 6 ක්වූ රු.324,096 ක් උපදේශක ගාස්තු වශයෙන් ගෙවීමට එකඟව පුද්ගලික සමාගමක් සමග ගිවිසුම්ගතව තිබූ අතර උපදේශක කටයුතු නිසි පරිදි ඉටුකර නොතිබියදී ඒ පිළිබඳව නොසලකා උපදේශක ගාස්තුවෙන් සියයට 89 ක්වූ රු.289,371 ක් එම සමාගම වෙත ගෙවා තිබුණි.

1.9 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

දඹාන ආදිවාසී ජන උරුම කේන්ද්‍රයේ නඩත්තු හා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් රු.100,000 ක මාසික ප්‍රතිපාදනයක් මහියංගනය ප්‍රාදේශීය ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණද උරුම කේන්ද්‍රය පිහිටුවීමේ අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය, රාජකාරී ස්වභාවය, පවත්වා ගතයුතු ලේඛන හා පවරා ඇති කාර්යභාර ඉටුකර ඇති බවට තහවුරු කර ගැනීමක් නොකර මෙම ප්‍රතිපාදන අඛණ්ඩව නිදහස් කර තිබුණි.

1.10 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

(අ ) **<u>අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා</u>**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 13 | 01 |
| (ii) | තෘතීයික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 450 | 410 | 40 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 401 | 333 | 68 |
| | | 869 | 758 | 111 |

(ආ) **<u>අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්</u>**

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| ද්විතීයික මට්ටම | 07 | මධ්‍යම සංස්කෘතික අරමුදල | අවුරුදු 2 සිට 23 දක්වා |
| ද්විතීයික මට්ටම | 01 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 2009 මැයි 11 සිට |
| ප්‍රාථමික මට්ටම | 06 | මධ්‍යම සංස්කෘතික අරමුදල | අවුරුදු 2 සහ 12 දක්වා |

2. **විසර්ජන ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

2.1 **විගණන විෂය පථය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 22 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

2.2 **ගිණුම් හා සැසඳුම් සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2.3 **විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ ) සිට ( ඉ ) දක්වා වූ පොදු

නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) <u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>

(i) දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| <u>ලේඛන වර්ගය</u> | <u>අදාල රෙගුලාසිය</u> |
|---|---|
| විසර්ජන සම්මත වැය ලෙජරය | මු.රෙ.447 (3) හා (6) |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ii) එකතුව රු.2,166,942 ක්වූ ගනුදෙනු 12 කට අදාල ලදුපත්, භාණ්ඩ ලැබීම් කුවිතාන්සි, ගිවිසුම්, පිරිවිතර ආදී ලිපි ලේඛන පවත්වා නොතිබුණි.

(ආ) <u>අයවැය විචලනය</u>

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 44 ත් සියයට 91 ත් අතර පරාසයක විය.

(ඇ) <u>අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ ලබාගත් ප්‍රතිපාදන</u>

"අයවැය සහාය සේවා හදිසි අවශ්‍යතා වගකීම්" ව්‍යාපෘතිය යටතේ වැය විෂයයන් 2 ක් සඳහා ලබාගත් රු.25,391,750 ක පරිපූරක ප්‍රතිපාදන වෙන් කිරීම් වලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනය කර තිබුණේ සියයට 67 ක ප්‍රමාණයක් පමණි.

(ඈ) <u>පොදු තැන්පත් ගිණුම</u>

(i) පොදු තැන්පත් ගිණුම් 2 ක පැවති වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.1,961,070 ක මුළු තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2009 ජනවාරි 29 දිනැති අංක 200/2009 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව 6000/0/0/3 කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම්වල මුදල් තැන්පත් කිරීම අත්හිටුවිය යුතු අතර, එම චක්‍රලේඛයට අතිරේක 2011 ජුනි 03 දිනැති අංක 218/2011 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව 6000/0/0/3 කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම් වල තවදුරටත් පවත්නා ශේෂ කල් ඉකුත් වූ තැන්පත් ලෙස සලකා මුදල් රෙගුලාසි 571(2) පරිදි රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. නමුත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අංක 6000/0/0/3/200 දරන තැන්පත් ගිණුමේ පැවති රු.964,702 ක ශේෂය සම්බන්ධයෙන් එම උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඉ) <u>**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**</u>

(i ) විෂය අංක 20601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.1,224,250 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදය පරිදි ණයදීම් සම්බන්ධයෙන් පවත්වාගත යුතු කේවල ශේෂ ලැයිස්තු උපලේඛන සම්පූර්ණ තොරතුරු ඇතුළත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(iii) වර්ෂ 3 කට වැඩි කාලයක සිට පවතින චලනය නොවන හිඟ ණය ශේෂ 26 කට අදාලව රු.178,757 ක් අයකර ගැනීමට 2013 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 427 හි විධානයන් අනුව දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පොත් සමග සසඳා නොතිබුණි. ණය සහ අත්තිකාරම් දැක්වෙන කේවල ශේෂ ලේඛනයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමග සසඳා නොතිබුණි.

පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ ලේඛනයේ එකතුව අතර රු.84,271 ක වෙනසක් පැවතුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්ම දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 2.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර තිබුණද ඉහත 2.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ හෙයින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූලව සැකසුනු එකක් නොවුණි.

### 2.4.3 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 2.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402 (1) ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජූලි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.4.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 ජූලි 30 දින වන විටත් පවත්වා නොතිබුණි.

## 2.6 කාර්ය සාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) දින 180 – 365 ත් අතර කාලයක් තුළ මුද්‍රණ කටයුතු අවසන් කළයුතු බැව් සඳහන් කරමින් ඉකුත් වර්ෂය හා ඊට පෙර වර්ෂ වලදී ශබ්ද කෝෂ 3 ක පිටපත් 2000 බැගින් මුද්‍රණය කිරීම සඳහා ඇනවුම් භාරදී වර්ෂ 1 සිට 5 දක්වා කාලයක් ගතවී තිබුණත්, 2012 දෙසැම්බර් 31 දිනටත් අවසන් කර නොතිබුණි.

(ii) දින 60 – 180 ත් අතර කාලය තුළ මුද්‍රණ කටයුතු අවසන් කළයුතු බව සඳහන් කරමින් 2010 වර්ෂය හා ඊට පෙර වර්ෂවලදී මුද්‍රණය සඳහා ඇනවුම් භාරදී තිබුණු ශබ්ද කෝෂ 1 ක, විශ්ව කෝෂ 2 ක හා උද්ධෘත 04 ක මුද්‍රණ කටයුතු සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලදී අවසන් කර තිබුණද ඒ සඳහා වසර 1 සිට 6 දක්වා කාලයක් ගතවී තිබුණි.

(iii) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2011 හා **2012** වර්ෂයන්ට අදාල ක්‍රියාකාරී සැලසුම් අනුව සිංහල විශ්වකෝෂයේ 13 වන කාණ්ඩය මුද්‍රණය නිම කළ යුතු බැව්

සඳහන් වුවද එම කාණ්ඩය සම්පාදනය කිරීමේ කටයුතු 2012 දෙසැම්බර් 31 දිනටත් අවසන් කර නොතිබුණි.

(ආ) **සැලසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

"ජාතික කලාකරු නාමාවලිය" සැකසීම පිළිබඳ කාර්යය 2010, 2011 හා 2012 ක්‍රියාකාරී සැලසුම් වල ඇතුළත්ව නොතිබුණි. එම වර්ෂ වල ප්‍රගති වාර්තාවලද මෙහි ප්‍රගතිය පිළිබඳව දක්වා නොතිබුණද 2012 දෙසැම්බර් 31 වන විට රු.699,071 ක් ඒ සඳහා වැයකර තිබුණි.

2.7 **අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්**

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශයට අනුව ලංසු කැඳවීම සඳහා දී ඇති කාලය වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ අවම වශයෙන් දින 07 ක් වත් වියයුතු වුවද සමරු කලාප, විවිධ ග්‍රන්ථ, ආරාධනා පත්‍ර හා සහරා මුද්‍රණය සඳහා ලංසු කැඳවීමේදී ඒ සඳහා ලබාදී තිබූ කාලය දින 1 සිට දින 4 දක්වා විය.

(ii) සමරු කලාප, ආරාධනා පත්‍ර හා ග්‍රන්ථ මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීමෙන් පසු ඉදිරිපත් කළ ලංසු පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7 වන මාර්ගෝපදේශය ප්‍රකාර තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 මාර්ගෝපදේශය අනුව මුද්‍රණය කර සපයන ලද ග්‍රන්ථ හා ලේඛන නියමිත පිරිවිතරවලට අනුකූල බවට තහවුරු කෙරෙන සහතිකයක් ඉදිරිපත් කර නොතිබුණි.

2.8 **අනාර්ථික ගනුදෙනු**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ ) ශබ්ද කෝෂ හා විශ්ව කෝෂ අත්පිටපත් මුද්‍රණය සඳහා ලබාදීම ප්‍රමාද කිරීම හේතුකොට ගෙන අතිරේක මුද්‍රණ වියදම් වශයෙන් රු.396,780 ක වියදමක් දැරීමට සිදුවී තිබුණි. මෙම ප්‍රමාදය දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ප්‍රමාද දෝෂයන් මත සිදුවී තිබුණි.

(ආ) 2012 ඔක්තෝබර් 30 දිනට ශබ්ද කෝෂ කාර්යාල බාහිර කර්තෘවරුන් 24 දෙනෙකු සඳහා රු.1,404,631 ක් ද, විශ්ව කෝෂ කාර්යාල බාහිර කර්තෘවරුන් 11 දෙනෙකු සඳහා රු.47,402 ක්ද වශයෙන් 2012 වර්ෂය වෙනුවෙන් ගෙවීම් කර තිබුණ ද ශබ්ද කෝෂ හා විශ්ව කෝෂ මුද්‍රණය සැලසුම්ගත පරිදි ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ඇ) විගණිත දිනය වූ 2012 ඔක්තෝබර් 30 දිනට වේයන්ගොඩ පොත් ගබඩාවේ තොග ලේඛනවල තොරතුරු අනුව වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවත එන සිංහල විශ්ව කෝෂයේ 3 සිට 12 දක්වා කාණ්ඩවලට අයත් රු.2,033,813 ක් වටිනා ග්‍රන්ථ 2761 ක්ද, සිංහල ශබ්ද කෝෂයේ විවිධ කාණ්ඩවලට අයත් රු.3,175,300 ක් වටිනා ග්‍රන්ථ 9852 ක්ද පැවති බව නිරීක්ෂණය විය. මෙම ග්‍රන්ථ අලෙවිය හෝ බෙදා හැරීම නොකිරීම හේතුවෙන් පොත් දූර්වර්ණ වීම හා වෙනත් ස්වාභාවික ආපදාවන්ට ලක්වීම සිදුවී තිබුණි.

2.9 <u>කළමනාකරණ දුර්වලතා</u>

මුද්‍රණය කරන ලද සිංහල විශ්ව කෝෂයේ 12 කාණ්ඩයේ පිටපත් 200 ක් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා තොග සහතික නිකුත් කරන අවස්ථාව වන විට එම පොත් තොගයෙන් අඩක් නිකුත් කර අවසන්ව තිබීම හා මුද්‍රණය කරන ලද සිංහල විශ්ව කෝෂයේ 12 කාණ්ඩයේ උද්ධෘත අංක 12 හා 13 න් පිටපත් 100 බැගින් ගබඩාවට භාරදීමට ප්‍රථම මුද්‍රණාලයෙන් ලබාගෙන තිබීම හේතුවෙන් මෙම ග්‍රන්ථ ගබඩාවට භාරගැනීම හා නිකුත් කිරීම සම්බන්ධව මනා තොග පාලනයක් පවත්වා නොතිබුණි.

2.10 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 16 | 11 |
| (ii) | තෘතීයික මට්ටම | 03 | - | 03 |
| (iii) | ද්විතීයික මට්ටම | 388 | 357 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 89 | 62 | 27 |
| (v) | වෙනත් - (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 82 | 61 | 21 |
| | එකතුව | 589 | 496 | 93 |